# ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය

# වාර්ෂික දත්ත ප්‍රකාශනය - 2015

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

1980 දශකයේ මුල් භාගයේ සිට වසර පහකට වරක් පවත්වන ලද ශ්‍රමබල සහ සමාජ ආර්ථික සමීක්ෂණය මගින් ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය, සේවා වියුක්තිය වැනි ශ්‍රමබල දර්ශකයන්හි ලාක්ෂණිකයන් පිළිබඳව දත්ත ප්‍රකාශයට පත් කරන ලදී. නමුත් රජයට රැකියා අවස්ථා පුළුල් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනයේදී රැකියා නියුක්තිය හා රැකියා වියුක්තිය වැනි දත්ත කෙටි කාල පරාසයන් සඳහා අවශ්‍ය විය. එම අවශ්‍යතාව සපුරාලීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 1990 වර්ෂයේ පළමු කාර්තුවේ සිට මේ දක්වා අඛණ්ඩව කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය සිදු කරනු ලබයි.

සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි වූ නිවාස ඒකක 25,000 ක වාර්ෂික නියැදියක් මත මෙම දත්ත ප්‍රකාශනය රඳා පවතී. 2015 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් දක්වා වූ මාස 12 ක කාලයක් තුල සමීක්ෂණය සිදු කරන ලදී. ශ්‍රමබල සංඛ්‍යාලේඛන නැවත බරතැබීමේ ක්‍රියාවලියෙන් පසු නව ශ්‍රේණියක් ලෙස මෙම දත්ත ප්‍රකාශනයේ ඇතුළත්ය. බර තැබීමේ සවිස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk වෙබ් අඩවියේ “Labour Force” උප මාතෘකාව යටතේ අන්තර්ගත කර ඇත.

## 1. ශ්‍රම බලකාය : ප්‍රධාන තොරතුරු - 2015

### වැඩ කරන වයසේ ජනගහනය

වයස අවුරුදු 15 හා ඊට වැඩි ස්ත්‍රී පුරුෂ සියළු ජනගහනය වැඩ කරන වයසේ ජනගහනය ලෙස හඳුන්වනු ලබයි. ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය සහ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නොවන ජනගහනය ලෙස මෙම පිරිස් කාණ්ඩ දෙකකින් වර්ගීකරණය කළ හැක.

### ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය (ශ්‍රම බලකාය)

වැඩ කරන වයසේ ජනගහනය අතුරින් කිසියම් නිශ්චිත කාල වකවානුවක් ලෙස යොදාගත් යොමු කාලය තුල (සමීක්ෂණ සතියට පෙර සතිය) රැකියා නියුතු සහ රැකියා විරහිතව පසුවූ මුළු ජනගහනය ශ්‍රම බලකාය ලෙස හඳුන්වයි.

**ශ්‍රම බලකාය = රැකියා නියුක්තිය + රැකියා වියුක්තිය**

**වගුව 1.1 : ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය- 2015**

| ස්ත්‍රී/පුරුෂ භාවය | ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය (ගණන) | ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය |
|---|---|---|
| **එකතුව** | 8,214,473 | 53.8 |
| පුරුෂ | 5,255,593 | 74.7 |
| ස්ත්‍රී | 2,958,880 | 35.9 |

**වගුව 1.2 : ස්ත්‍රී පුරුෂ භාවය අනුව ආර්ථික වශයෙන් ක්‍රියාශීලි/ක්‍රියාශීලි නොවන ජනගහනයේ ව්‍යාප්තිය - 2015**

| ස්ත්‍රී/පුරුෂ භාවය | ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය | | ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නොවන ජනගහනය | |
|---|---|---|---|---|
| | ගණන | % | ගණන | % |
| **එකතුව** | **8,214,473** | **100.0** | **7,067,473** | **100.0** |
| පුරුෂ | 5,255,593 | 64.0 | 1,781,352 | 25.2 |
| ස්ත්‍රී | 3,958,880 | 36.0 | 5,286,121 | 74.8 |

2015 වසර සඳහා වාර්තා වූ ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය 53.8 කි. (වගුව 1.1) ඇස්තමේන්තු ගත ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය මිලියන 8.2 කි. මේ අය අතුරින් මිලියන 5.3 ක් (64.0%) ක් පුරුෂ පක්ෂය වෙයි. ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නොවන ජනගහනය මිලියන 7.1 ක් වන අතර, මේ අය අතරින් බහුතරය කාන්තාවන්ය (74.8%).

**වගුව 1.3 : ස්ත්‍රී පුරුෂ භාවය හා දිස්ත්‍රික්කය අනුව ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය - 2015**

| දිස්ත්‍රික්කය | ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය (%) | | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| **එකතුව** | **100.0** | **64.0** | 36.0 |
| කොළඹ | 100.0 | 66.4 | 33.6 |
| ගම්පහ | 100.0 | 65.7 | 34.3 |
| කළුතර | 100.0 | 64.4 | 35.6 |
| මහනුවර | 100.0 | 63.5 | 36.5 |
| මාතලේ | 100.0 | 60.1 | 39.9 |
| නුවරඑළිය | 100.0 | 55.5 | 44.5 |
| ගාල්ල | 100.0 | 64.3 | 35.7 |
| මාතර | 100.0 | 63.8 | 36.2 |
| හම්බන්තොට | 100.0 | 64.5 | 35.5 |
| යාපනය | 100.0 | 70.9 | 29.1 |
| මන්නාරම | 100.0 | 80.2 | 19.8 |
| වව්නියාව | 100.0 | 64.8 | 35.2 |
| මුලතිව් | 100.0 | 70.4 | 29.6 |
| කිලිනොච්චි | 100.0 | 73.1 | 26.9 |
| මඩකලපුව | 100.0 | 72.0 | 28.0 |
| අම්පාර | 100.0 | 75.7 | 24.3 |
| ත්‍රිකුණාමලය | 100.0 | 75.7 | 24.3 |
| කුරුණෑගල | 100.0 | 61.0 | 39.0 |
| පුත්තලම | 100.0 | 65.3 | 34.7 |
| අනුරාධපුර | 100.0 | 58.6 | 41.4 |
| පොළොන්නරුව | 100.0 | 67.3 | 32.7 |
| බදුල්ල | 100.0 | 57.6 | 42.4 |
| මොනරාගල | 100.0 | 60.8 | 39.2 |
| රත්නපුර | 100.0 | 62.2 | 37.8 |
| කෑගල්ල | 100.0 | 60.9 | 39.1 |

# 2. රැකියා නියුක්තිය : ප්‍රධාන තොරතුරු - 2015

**වගුව 2.1 : රැකියා නියුක්තිය පිළිබඳ සංඛ්‍යාති - ස්ත්‍රී පුරුෂ භාවය අනුව - 2015**

| රැකියා නියුක්තිය පිළිබඳ සංඛ්‍යාති | ශ්‍රී ලංකාව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| රැකියා නියුක්ති ජනගහනය | 7,830,976 | 5,097,798 | 2,733,178 |
| ශ්‍රම බලකාය | 8,214,473 | 5,255,593 | 2,958,880 |
| රැකියා නියුක්ති අනුපාතය | 95.3 | 97.0 | 92.4 |

**රැකියා නියුක්තිය** : අදාල යොමු කාලය තුල, වැටුප් ලබන සේවකයින්, සේවා යෝජකයින්, තමාගේම ආර්ථික කටයුතුවල නිරතවන්නන් හා පවුලේ ආර්ථික කටයුතුවලට දායකවන්නන් රැකියා නියුක්තිකයින් ලෙස සැලකේ.

රැකියාවක් ඇති පුද්ගලයින් තාවකාලික හේතු මත අදාල යොමු කාලය තුල රැකියාවේ නිරත නොවුවද, ඔවුන්ද මේ යටතට ගැනේ.

**වගුව 2.2 : රැකියා නියුක්ති ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය, ප්‍රධාන කර්මාන්තය අනුව - 2015**

| අංශය/පළාත | එකතුව | ප්‍රධාන කර්මාන්තය | | |
|---|---|---|---|---|
| | | කෘෂි කර්මාන්ත | නිෂ්පාදන | සේවා |
| **ශ්‍රී ලංකාව** | 100.0 | 28.7 | 25.8 | 45.6 |
| නාගරික | 100.0 | 4.8 | 25.8 | 69.4 |
| ග්‍රාමීය | 100.0 | 30.6 | 26.6 | 42.8 |
| වතු | 100.0 | 72.6 | 12.5 | 14.8 |
| **පළාත** | | | | |
| බස්නාහිර | 100.0 | 6.2 | 33.2 | 60.5 |
| මධ්‍යම | 100.0 | 39.7 | 19.5 | 40.8 |
| දකුණ | 100.0 | 33.5 | 25.5 | 41.0 |
| උතුර | 100.0 | 33.2 | 19.6 | 47.3 |
| නැගෙනහිර | 100.0 | 29.1 | 22.8 | 48.1 |
| වයඹ | 100.0 | 31.0 | 29.1 | 40.0 |
| උතුරු මැද | 100.0 | 49.1 | 15.7 | 35.2 |
| ඌව | 100.0 | 55.9 | 12.3 | 31.8 |
| සබරගමුව | 100.0 | 35.3 | 29.1 | 35.6 |

| දිස්ත්‍රික්කය | එකතුව | ප්‍රධාන කර්මාන්තය | | |
|---|---|---|---|---|
| | | කෘෂි කර්මාන්ත | නිෂ්පාදන | සේවා |
| කොළඹ | 100.0 | 1.8 | 27.7 | 70.5 |
| ගම්පහ | 100.0 | 4.6 | 38.8 | 56.6 |
| කළුතර | 100.0 | 17.0 | 32.6 | 50.4 |
| මහනුවර | 100.0 | 22.7 | 23.4 | 53.9 |
| මාතලේ | 100.0 | 38.1 | 21.8 | 40.0 |
| නුවරඑළිය | 100.0 | 67.1 | 11.9 | 21.0 |
| ගාල්ල | 100.0 | 30.5 | 26.4 | 43.1 |
| මාතර | 100.0 | 33.4 | 25.1 | 41.5 |
| හම්බන්තොට | 100.0 | 38.9 | 24.4 | 36.7 |
| යාපනය | 100.0 | 45.5 | 21.0 | 33.5 |
| මන්නාරම | 100.0 | 35.2 | 21.2 | 43.5 |
| වව්නියාව | 100.0 | 26.5 | 28.2 | 45.3 |
| මුලතිව් | 100.0 | 32.5 | 20.7 | 46.8 |
| කිළිනොච්චිය | 100.0 | 26.8 | 19.3 | 53.9 |
| මඩකලපුව | 100.0 | 30.2 | 21.0 | 48.9 |
| අම්පාර | 100.0 | 45.9 | 8.8 | 45.2 |
| ත්‍රිකුණාමලය | 100.0 | 28.3 | 19.4 | 52.3 |
| කුරුණෑගල | 100.0 | 33.2 | 29.3 | 37.6 |
| පුත්තලම | 100.0 | 26.0 | 28.6 | 45.3 |
| අනුරාධපුරය | 100.0 | 51.5 | 14.3 | 34.2 |
| පොළොන්නරුව | 100.0 | 43.1 | 19.3 | 37.6 |
| බදුල්ල | 100.0 | 57.3 | 12.0 | 30.7 |
| මොනරාගල | 100.0 | 53.5 | 12.8 | 33.7 |
| රත්නපුරය | 100.0 | 43.3 | 26.3 | 30.3 |
| කෑගල්ල | 100.0 | 23.5 | 33.2 | 43.4 |

**වගුව 2.3 : රැකියාවේ සේවා තත්ත්ව හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව රැකියා නියුක්ති ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය - 2015**

| සේවා තත්ත්වය | එකතුව | ස්ත්‍රී පුරුෂ භාවය | |
|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී |
| **එකතුව** | 100.0 | 65.1 | 34.9 |
| සේවක | 100.0 | 65.7 | 34.3 |
| සේවායෝජක | 100.0 | 87.2 | 12.8 |
| තමාගේම වැඩ කටයුතු කරන්නා | 100.0 | 73.1 | 26.9 |
| පවුලේ ආර්ථික කටයුතු වලට දායකවන්නා | 100.0 | 22.0 | 78.0 |

**රූපය 2.1 : ස්ත්‍රී පුරුෂ භාවය අනුව රැකියා නියුක්ති ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය - 2015**



# 3. රැකියා වියුක්තිය: ප්‍රධාන තොරතුරු - 2015

**රැකියා වියුක්තිය :**

දැනට රැකියාවක් නොමැතිව, රැකියාවක් සොයමින් සිටින, සමීක්ෂණ සතියට පෙර සති හතරක කාල වකවානුවකදී රැකියාවක් සෙවීමට කිසියම් පියවරක් ගෙන ඇති, එසේම ඉදිරි සති දෙක ඇතුලත ලැබෙන රැකියාවක් භාර ගැනීමේ හැකියාවද ඇති පුද්ගලයින් රැකියා වියුක්තිය යටතට ගැනේ.

**වගුව 3.1 : වයස් කාණ්ඩ සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව විරැකියා අනුපාතයන් - 2015**

| වයස් කාණ්ඩ (අවුරුදු) | එකතුව | ස්ත්‍රී පුරුෂ භාවය | |
|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී |
| **එකතුව** | 4.7 | 3.0 | 7.6 |
| 15 - 24 | 20.8 | 16.6 | 27.4 |
| 25 - 29 | 9.4 | 4.4 | 17.5 |
| 30 - 39 | 3.1 | 1.6 | 5.7 |
| 40 ට වැඩි | 1.0 | 0.6 | 1.8 |

2015 වසරේ වාර්තා වූ සමස්ත විරැකියා ජනගහනය 383,496 කි. පුරුෂයින්ගේ විරැකියා අනුපාතය 3.0% ක් වූ අතර, ස්ත්‍රීන් සඳහා විරැකියා අනුපාතය 7.6% කි. සියළු වයස් කාණ්ඩ සඳහා ස්ත්‍රීන්ගේ විරැකියා අනුපාතය පුරුෂයින්ගේ විරැකියා අනුපාතයට වඩා වැඩිය. වයස අවුරුදු 15-24 අතර කාණ්ඩයේ විරැකියා අනුපාතය ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය සඳහාම අනෙක් වයස් කාණ්ඩ වලට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන තිබුණි (වගුව 3.1).

**වගුව 3.2 : ස්ත්‍රී පුරුෂ භාවය හා ලබා ඇති අධ්‍යාපන මට්ටම අනුව විරැකියා අනුපාතයන් - 2015**

| අධ්‍යාපන මට්ටම | එකතුව | ස්ත්‍රී පුරුෂ භාවය | |
|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී |
| **එකතුව** | 4.7 | 3.0 | 7.6 |
| අ.පො.ස. (සා.පෙ.) දක්වා | 2.7 | 2.0 | 4.3 |
| අ.පො.ස. (සා.පෙ.) සමත් | 6.4 | 5.1 | 9.0 |
| අ.පො.ස. (උ.පෙ.) හා ඉන් ඉහළ | 9.2 | 4.7 | 13.5 |

වගුව 3.2 අනුව අධ්‍යාපන මට්ටම අ.පො.ස (උ.පෙළ) හා ඉන් ඉහළ කාණ්ඩයේ වැඩිම විරැකියා අනුපාතය (9.2%) වාර්තා විය. පුරුෂ පක්ෂයේ ඉහළම විරැකියා අනුපාතය (5.1%) අ.පො.ස (සා.පෙළ.) සමත් කාණ්ඩය තුළින් වාර්තා වන අතර ස්ත්‍රී පක්ෂයේ ඉහළම විරැකියා අනුපාතය (13.5%) අ.පො.ස (උ.පෙ) හා ඉන් ඉහළ අධ්‍යාපනය ලත් කාණ්ඩය තුළින් වාර්තා විය.

වගුව 3.3 හා 3.4 මගින් අංශය, පළාත හා දිස්ත්‍රික්කය අනුව විරැකියා අනුපාතයන්හි ව්‍යාප්තිය දක්වයි. වැඩිම විරැකියා අනුපාතය (5.9%) සබරගමුව පළාතෙන් වාර්තා විය. සියලුම පළාත්වල ස්ත්‍රීන්ගේ විරැකියා අනුපාතය පුරුෂයින්ගේ විරැකියා අනුපාතයට වඩා වැඩිය. ඉහළම ස්ත්‍රී විරැකියා අනුපාතය වාර්තා වනුයේ උතුර හා නැගෙනහිර පළාත් වලිනි.

වැඩිම විරැකියා අනුපාතය (8.3%) කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර අඩුම විරැකියා අනුපාතය (2.3%) වාර්තා වනුයේ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙනි.

| අංශය/පළාත | විරැකියා අනුපාතය (%) | | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| **ශ්‍රී ලංකාව** | 4.7 | 3.0 | 7.6 |
| **අංශය** | | | |
| නාගරික | 4.6 | 3.5 | 6.7 |
| ග්‍රාමීය | 4.8 | 2.9 | 8.0 |
| වතු | 3.5 | 2.7 | 4.6 |
| **පළාත** | | | |
| බස්නාහිර | 4.1 | 3.1 | 6.0 |
| මධ්‍යම | 4.7 | 3.4 | 6.6 |
| දකුණ | 5.8 | 3.7 | 9.6 |
| උතුර | 5.3 | 2.6 | 12.0 |
| නැගෙනහිර | 5.7 | 3.2 | 13.1 |
| වයඹ | 3.8 | 2.1 | 6.4 |
| උතුරු මැද | 3.1 | 1.5 | 5.8 |
| ඌව | 4.7 | 2.3 | 8.1 |
| සබරගමුව | 5.9 | 3.8 | 9.2 |

සටහන :
විචලතා සංගුණකය (CV) වැඩි අගයක් ගන්නා බැවින් අඳුරුකර ඇති අගයන් භාවිතයේදී සැලකිලිමත් විය යුතුය.

**වගුව 3.4 : විරැකියා අනුපාතය දිස්ත්‍රික්ක අනුව - 2015**

| දිස්ත්‍රික්කය | විරැකියා අනුපාතය (%) | දිස්ත්‍රික්කය | විරැකියා අනුපාතය (%) |
|---|---|---|---|
| කොළඹ | 3.6 | කිලිනොච්චිය | 5.7 |
| ගම්පහ | 4.4 | මඩකලපුව | 4.8 |
| කළුතර | 4.5 | අම්පාර | 7.3 |
| මහනුවර | 5.4 | ත්‍රිකුණාමලය | 4.3 |
| මාතලේ | 5.3 | කුරුණෑගල | 4.0 |
| නුවරඑළිය | 3.2 | පුත්තලම | 3.3 |
| ගාල්ල | 5.0 | අනුරාධපුර | 3.5 |
| මාතර | 6.5 | පොළොන්නරුව | 2.3 |
| හම්බන්තොට | 6.3 | බදුල්ල | 5.3 |
| යාපනය | 5.7 | මොනරාගල | 3.5 |
| මන්නාරම | 6.4 | රත්නපුර | 4.2 |
| වව්නියාව | 4.3 | කෑගල්ල | 8.3 |
| මුලතිව් | 3.7 | | |

සටහන :
විචලතා සංගුණකය (CV) වැඩි අගයක් ගන්නා බැවින් අඳුරුකර ඇති අගයන් භාවිතයේදී සැලකිලිමත් විය යුතුය.

## තෝරාගත් ශ්‍රමබල දර්ශකයන් ..... (නැවත බර තැබූ ශ්‍රේණිය)

| දර්ශක | වසර | | | | |
|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
| **ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය** | | | | | |
| ස්ත්‍රී/පුරුෂ භාවය අනුව | | | | | |
| දෙපාර්ශ්වයම | 52.9 | 52.5 | 53.7 | 53.2 | 53.8 |
| පුරුෂ | 74.0 | 74.9 | 74.9 | 74.6 | 74.7 |
| ස්ත්‍රී | 34.3 | 32.9 | 35.4 | 34.6 | 35.9 |
| **පදිංචි ප්‍රදේශය අනුව** | | | | | |
| එකතුව | 52.9 | 52.5 | 53.7 | 53.2 | 53.8 |
| නාගරික | 47.8 | 48.3 | 47.7 | 48.7 | 48.6 |
| ග්‍රාමීය | 53.8 | 53.4 | 54.9 | 54.1 | 54.8 |
| **විරැකියා අනුපාතය** | | | | | |
| ස්ත්‍රී/පුරුෂ භාවය අනුව | | | | | |
| දෙපාර්ශ්වයම | 4.2 | 4.0 | 4.4 | 4.3 | 4.7 |
| පුරුෂ | 2.7 | 2.8 | 3.2 | 3.1 | 3.0 |
| ස්ත්‍රී | 7.1 | 6.3 | 6.6 | 6.5 | 7.6 |
| **තෝරාගත් වයස් කාණ්ඩ අනුව (අවුරුදු)** | | | | | |
| 20 – 29 | 12.4 | 11.3 | 13.1 | 13.6 | 14.2 |
| 20 – 24 | 17.7 | 16.7 | 19.3 | 19.9 | 19.7 |
| 25 – 29 | 7.7 | 6.6 | 7.6 | 8.2 | 9.4 |
| **තෝරාගත් අධ්‍යාපන මට්ටම් අනුව** | | | | | |
| අ.පො.ස. (උ.පෙළ) සහ ඉන් ඉහල | | | | | |
| දෙපාර්ශවයම | 9.1 | 7.6 | 8.7 | 8.2 | 9.2 |
| පුරුෂ | 5.4 | 4.6 | 5.7 | 5.4 | 4.7 |
| ස්ත්‍රී | 13.2 | 10.8 | 11.8 | 11.1 | 13.5 |
| **රැකියා නියුක්ත ජනගහනය** | | | | | |
| ස්ත්‍රී/පුරුෂ භාවය අනුව | | | | | |
| දෙපාර්ශ්වයම | 7,591,591 | 7,488,704 | 7,681,279 | 7,700,489 | 7,830,976 |
| පුරුෂ | 5,061,214 | 5,046,057 | 5,024,340 | 5,075,426 | 5,097,798 |
| ස්ත්‍රී | 2,530,377 | 2,442,647 | 2,656,938 | 2,625,064 | 2,733,178 |
| **සේවයේ නියුතු කර්මාන්තය (ප්‍රතිශතයක් ලෙස)** | | | | | |
| එකතුව | 7,591,591 | 7,488,704 | 7,681,279 | 7,700,489 | 7,830,976 |
| % | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |
| කෘෂිකර්මාන්තය | 2,511,266 | 2,333,342 | 2,321,215 | 2,222,859 | 2,244,547 |
| % | 33.1 | 31.2 | 30.2 | 28.9 | 28.7 |
| නිෂ්.කර්මාන්තය | 1,819,608 | 1,940,615 | 1,996,730 | 2,027,426 | 2,018,171 |
| % | 24.0 | 25.9 | 26.0 | 26.3 | 25.8 |
| සේවා | 3,260,717 | 3,214,746 | 3,363,334 | 3,450,205 | 3,568,259 |
| % | 43.0 | 42.9 | 43.8 | 44.8 | 45.6 |
| **සතියට වැඩකරන පැය ගණන අනුව ( ප්‍රතිශතයක් ලෙස )** | | | | | |
| එකතුව | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |
| 0# | 5.2 | 4.5 | 5.2 | 5.2 | 5.5 |
| 1 – 9 | 1.7 | 1.1 | 1.8 | 1.3 | 1.7 |
| 10 – 39 | 29.9 | 26.1 | 27.5 | 27.6 | 27.2 |
| 40 ට වැඩි | 63.2 | 68.3 | 65.5 | 65.9 | 65.7 |

# රැකියාවක් තිබූ නමුත් යොමු කාලය තුල රැකියාවෙහි යෙදී නොමැත.

සටහන : වයස අවුරුදු 15 සහ ඊට වැඩි ජනගහනය වැඩ කරන වයසේ ජනගහනය ලෙස සලකා ඇත.


**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, නො. 306/71, පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව.**
**දුරකථන : 0112147001 ෆැක්ස් : 0112147010, ඊමේල් : sample.survey @ statistics.gov.lk**
**අන්තර්ජාලය: www.statistics.gov.lk**